# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2455/16 – 2025 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා – 2025.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 99 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/5/2018/HA/04.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* DS/VN/LA.A/MSJ232.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

**I. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, වලිකාමම් උතුර, තෙල්ලිපලෙයි.

**II. ඉඩමේ විස්තරය.–** උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර (තෙල්ලිපලෙයි) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 232 මාවිඩ්ඩපුරම් දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාවිඩ්ඩපුරම් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PP යා 2936 හා 2019.08.15 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 - පුලියාඩි - ප්‍රමාණය: හෙක්.** 0.0180

උතුරට: පුලියාඩි, සෙල්වරාජා අජිත්කුමාර් සහ පුලියාඩි, මනික්කම් රාසරත්නම්; නැගෙනහිරට: පුලියාඩි, මනික්කම් රාසරත්නම් සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ පුලියාඩි, බාලසිංගම් රමේෂ්; බටහිරට: පුලියාඩි, බාලසිංගම් රමේෂ් සහ පුලියාඩි, සෙල්වරාජා අජිත් කුමාර්.

EOG 09 – 0220

1A – G 045432– 14 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 65 දරන ආඥාව**

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2017/IR/448-H.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: අනු/10/5/4/පහළ
මල්වතුඔය ජලාශය.

අංක 2268/9 හා 2022.02.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල භාෂාවෙන් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට අදාළ 2022 අංක 65 දරන ආඥාවේ උපලේඛනයේ සිංහල භාෂාවෙන් සඳහන් කර ඇති 2A පිටුවේ අනු අංක 18 යටතේ ඇති කැබලි අංක 17 යන්න" , "කැබලි අංක 18 ලෙස" නිවැරදි විය යුතුය.

එසේම 3A පිටුවේ කැබලි අංක 33හි බටහිර මායිම් "රජයේ ළඳු කැලය, කැබලි අංක 57 සහ 37 යන්න", "රජයේ ළඳු කැළය, කැබලි අංක 57 සහ 32", ලෙස ද, "කැබලි අංක 35 හි දකුණු මායිම කැබලි අංක 30 සහ 22 යන්න", "කැබලි අංක 36 සහ 22 ලෙසද," 4A පිටුවේ සඳහන් "කැබලි අංක 45 හි උතුරු මායිම කැබලි අංක 42 සහ රජයේ ළඳු කැලය" යන්න, "කැබලි අංක 44 සහ රජයේ ළඳු කැලය" ලෙසද, නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 02 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 – 0221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.